# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 787/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 09/05/2024<br>පැය 1130 |

**මාධ්‍ය නිවේදනය**

**01. නීති විරෝධී ලෙස මෙරටට ගෙන්වන ලද කුෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය - ගුවන්තොටුපල ඒකකය.**

2024.05.08 වන දින රාත්‍රී කාලයේ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර බැංකොක් සිට මෙරටට ගුවන් යානයකින් පැමිණි පුද්ගලයෙකු කැනබිස් සැටැයිවා එල් අඩංගු කුෂ් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 05 ග්‍රෑම් 278 ක් සන්තකයේ තබාගැනීම හා ජාවාරම් කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු .. ක් වන හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශයේ ගුවන්තොටුපල ඒකකය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්ගමුව පොලිස් ස්ථානය.**

2024.05.08 වන දින රාත්‍රී කාලයේ ගල්ගමුව පොලිස් වසමේ යාය 05, ගල්ගමුව ප්‍රදේශයේ ගල්ගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත සිදු කල වැටලීමකදී මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු ගල්මුව පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 64 ක් වන යාය 05, ගල්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්ගමුව පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවන් දෙදෙනකු අත්අඩංගුවට - මුල්ලේරියාව පොලිස් ස්ථානය.

2024.05.08 වන දින රාත්‍රී කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ ගල්කොටුවේ පාර, මුල්ලේරියාව ප්‍රදේශයේදී මුල්ලේරියාව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී ලෙස මත්පැන් ගබඩා කරන ස්ථානයක් වටලා ගබඩා කරන ලද නීති විරෝධී මත් පැන් මිලි ලීටර් 675000ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 25ක් හා 58ක් වන කැලණිය සහ වැල්ලම්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මුල්ලේරියාව පොලීසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**